## මාර්ගගතව අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

**A.** මාර්ගගත **(Online)** විභාග අයදුම්පත ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පිරවිය යුතු ය.

**B.** සම්පූර්ණ කරන ලද තොරතුරු නිවැරදි ව හා දී ඇති උපදෙස් පරිදි සම්පූර්ණ කර තිබේදැයි පරීක්ෂා කර තහවුරු කරගන්න. (පොදු උපදෙස් හා තාක්ෂණික පරිදි)

**C.** ඉන් පසු **"Submit" click** කර අයදුම්පත මාර්ගගතව යොමු කළ යුතු ය.

**D.** අයදුම්පතේ මෘදු පිටපත බාගත කර **(download),** මුද්‍රිත පිටපතක් **(printout)** ළඟ තබා ගත යුතු ය.

**E.** අදාළ දෘඩ පිටපත සම්මුඛ පරීක්ෂණයන් සඳහා කැඳවීමේ දී රැගෙන ආ යුතු ය.

**F.** දී ඇති උපදෙස්වලට පටහැනි ව යොමු කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**<u>(අ) පොදු උපදෙස් :</u>**

1. අයදුම්පත පිරවීමේ දී විශේෂිත අක්ෂර (Special characters) වන " " ? : { } [ ] , ! ` ~ # $ % ^ * < > = + - _ | නොයෙදිය යුතු ය. එවැනි විශේෂිත අක්ෂර යොදා සම්පූර්ණ කර ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
2. අයදුම්කරු විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පතේ දත්ත, මාර්ගගත පද්ධතියට ඇතුලත් කිරීමට පෙර, පළාත් අධ්‍යාපන ලේකම් විසින් පනවන ලද නීති රීතිවලට එකඟ වන බව තහවුරු කළ යුතු ය.
3. අයදුම්පත් සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන බලපැවැත්වේ.
    - අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සහිත අයදුම්පත් කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
    - ප්‍රමාද වී ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සම්බන්ධ ව දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වග කියනු නොලැබේ.

4. විමසීම් කිරීම -
    - අධ්‍යාපන අංශය (දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය) – 0912030702
    - විද්‍යුත් තැපැල - exams.moesp@gmail.com
5. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එහි සඳහන් වන තොරතුරු කිසිවක් කිසිදු හේතුවක් මත පසුව වෙනස් කරනු නොලැබේ. එබැවින් අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ පූර්ණ වගකීම වේ.
6. අයදුම්පතේ මුද්‍රිත පිටපතේ සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ.

## (ආ) තාක්ෂණික උපදෙස් :

**1. පද්ධතියට ප්‍රවේශ වීම**

I. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියට ප්‍රවේශ වන්න. (www.edumin.sp.gov.lk)

II. එහි සේවාවන් (Services) යටතේ ඇති Online Applications (Recruitment of Teachers) මුහුණත මත click කරන්න.

III. ඉන් පසු ඔබට පහත දිස් වන වෙබ් පිටුවට ප්‍රවේශ විය හැක.




| Subjects | Action | Instructions |
|---|---|---|
| 01. දකුණු පළාත් සභා සිංහල මාධ්‍ය පාසල් වල පවතින විශේෂ අධ්‍යාපන ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම. Recruitment of Graduates and Diploma holders to the Sri Lanka Teachers' Service, for the Special Education Teacher Vacancies in the Southern Provincial Council Sinhala Medium Schools | APPLY | DOWNLOAD |
| 02. දකුණු පළාත් සභා සිංහල මාධ්‍ය පාසල් වල පවතින භාෂාමය විෂයන්හි (ප්‍රංශ භාෂාව සහ ජපන් භාෂාව) ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1(අ) ශ්‍රේණියට බඳවා ගැනීම. Recruitment of Graduates to the Grade 1 (A) Class 3 of the Sri Lanka Teachers' Service, for the Languages (French & Japanese) Teacher Vacancies in the Southern Provincial Council Sinhala Medium Schools | APPLY | DOWNLOAD |
| 03. දකුණු පළාත් සභා සිංහල මාධ්‍ය පාසල් වල පවතින ගෘහ ආර්ථික විද්‍යාව ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් හා උසස් ජාතික ඩිප්ලෝමාධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම. Recruitment of Graduates and Higher National Diploma holders to the Sri Lanka Teachers' Service for the vacancies in Home Economics Teachers in the Sinhala Medium Schools of the Southern Provincial Council. | APPLY | DOWNLOAD |
| 04.දකුණු පළාත් සභා සිංහල මාධ්‍ය පාසල් වල පවතින සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය ගුරු පුරප්පාඩු සඳහා උසස් පෙළ සමතුන් ගුරු සහායකයින් ලෙස බඳවා ගැනීම. Recruitment of Advanced Level Passers as Teacher Assistants for the vacancies in Health & Physical Studies Teachers in the Sinhala Medium Schools of the Southern Provincial Council. | APPLY | DOWNLOAD |
| 05. දකුණු පළාත් සභා දෙමළ මාධ්‍ය පාසල් වල විෂය ඒකක 27ක පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන්, උසස් ජාතික ඩිප්ලෝමාධාරීන් හා උසස් පෙළ සමතුන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම. Recruitment of Graduates, Higher National Diploma Holders and Advanced Level graduates to the Sri Lanka Teachers' Service for the existing vacancies in 27 subject units of the Southern Provincial Council Tamil Medium Schools. | APPLY | DOWNLOAD |

- අයදුම් කළ හැකි විභාග සම්බන්ධ තොරතුරු ඉහත කවුළුවෙන් දිස් වේ.

IV. එහි “Instruction” යටතේ දක්වා ඇති **“Download icon”** මත click කිරීමෙන් විභාගය සම්බන්ධ ගැසට් නිවේදනය බාගත කළ හැකි අතර **“Apply”** මත click කිරීමෙන් ඒ ඒ විභාගයට අදාළ අයදුම්පත වෙත ප්‍රවේශ විය හැක.

## 2. අයදුම්පත සම්පූර්ණ කිරීම

පහත අයිතමයන් සම්පූර්ණ කිරීමේ දී දක්වා ඇති උපදෙස් පිළිපදින්න.

**I.** සම්පූර්ණ කළ යුතු මාර්ගගත අයදුම්පතේ ඇති අයිතමයන්හි * සලකුණ යොදා ඇති සෑම අයිතමයක්ම ඔබ විසින් අනිවාර්යයෙන් පිරවිය යුතු වේ.

**II.** සම්පූර්ණ නම **(Full Name)**, මුලකුරු සමග නම **(Name With Initials)** ඇතුලත් කිරීමේ දී පහත නිදසුන් පරිදි ENGLISH BLOCK CAPITALS යොදා ගනිමින් ඔබගේ නම අදාළ අයිතමයන්හි ඇතුලත් කරන්න.


Full Name (in English – Block letters) *
KODIKARA HEWAGE SAMAN WEERASINGHE
Full Name (in Sinhala) *
කොඩිකාර හේවගේ සමන් වීරසිංහ
Name With Initials (in English) *
WEERASINGHE K. H. S.
Name With Initials (in Sinhala) *
වීරසිංහ කේ. එච්. එස්.

**III.** ස්ථිර ලිපිනය **(Permanent Address)** හා තාවකාලික ලිපිනය **(Temporary Address)** මේ සඳහා පහත උදාහරණ බලන්න.

| | | |
|---|---|---|
| No. 24/1,<br>Sadaham Mawatha, | } | Address without Postal Town (ලිපිනය) |
| Baddegama. | - | Postal Town (ලිපිනයට අයත් තැපැල් නගරය) |

- ස්ථිර ලිපිනය හා තාවකාලික ලිපිනයන් වෙනස් විය හැකි බැවින් නිවැරදි ව

ලිපිනයන් ඇතුලත් කරන්න. ( ඔබ විසින් තාවකාලික ලිපිනයක් ඇතුලත් කරනු ලැබුවහොත් සම්මුඛ පරීක්ෂණ සඳහා වන ලිපි, එම ලිපිනයට යොමු කරනු ඇත.)

**IV.** ස්ථිර පදිංචියට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය **(Divisional Secretariat)**, ජාතික හැඳුනුම්පත් අංකය **(NIC Number)**, ස්ත්‍රී / පුරුෂ භාවය **(Gender)** හා අනෙකුත් අයිතමයන් නිවැරදි ව පුරවන්න.


Divisional Secretariat*

Baddegama

NIC Number *

920590250V

Birth Date *

02/28/1992

Age to 2021.09.21 :

Age : 29

Contact Number *

0712165197

Gender*

Male Female

Civil Status *

Married Unmarried

**V.** සම්පූර්ණ කරන ලද අයදුම්පත් මාර්ගගතව යොමු කිරීම.

නිවැරදි ව සම්පූර්ණ කරන ලද අයදුම්පත්, දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් දක්වා ඇති විභාග කොන්දේසීන්ට එකඟ වෙමින් යොමු කළ හැකි වේ.


I declare that the information given here is true to the best of my knowledge and belief. I read and understand all the terms and conditions mentioned in the Instruction sheet and I declare that I submit this application in accordance with those terms and conditions. I would also like to work in any school nominated by the Southern Provincial Ministry of Education. I am aware that I will be subject to dismissal if I am found unfit to be a teacher after being selected for this position.

I further state that I am subject to the rules and regulations imposed by the Ministry of Education of the Southern Province regarding conducting interviews and testing qualifications and will not change any of the information contained herein.

SUBMIT CLEAR

- අයදුම්පතෙහි සියලු තොරතුරු ඇතුලත් කළ පසු ඉදිරියට යාම සඳහා **“SUBMIT”** Click කළ යුතු ය.

- **“SUBMIT”** button Click කළ පසු තිරයෙහි ඉහලින්, පහත පරිදි **“Alert”** window එකක් පෙන්නුම් කරනු ලබන අතර, එහිදී ඔබ විසින් ඇතුලත් කරන ලද තොරතුරු නැවත පරීක්ෂා කිරීම සඳහා **"Cancel"** button Click කළ හැකි අතර, එවිට අයදුම්පත පූරණය කිරීමට අදාළ වූ කොටස

වෙත ගොස් අදාළ වෙනස්කම් වේ නම් සිදු කළ හැක. එසේ නැවත පරීක්ෂා කිරීම සඳහා අවශ්‍යතාවයක් නොවන්නේ නම් **"OK"** Click කරන්න.




- නිවැරදි ව අයදුම්පත සම්පූර්ණ කර නොතිබීම, අයදුම්පත ප්‍රතික්ෂේප වීමට හේතු විය හැකි බැවින් මෙම පියවරේ දී ඔබ විසින් පූරණය කරන ලද දත්තයන් නැවත පරීක්ෂා කොට බැලීම සුදුසු වේ.

**3. අයදුම්පත බාගත කිරීම (Download) හා මුද්‍රිත පිටපත (Print) ලබා ගැනීම.**

පහත රූපයේ පරිදි **"DOWNLOAD MY APPLICATION" Click** කිරීමෙන් ඔබගේ අයදුම්පත බාගත කර ගත හැක. බාගත කර ගත් පසු එහි මුද්‍රිත පිටපතක් ලබාගන්න. එම මුද්‍රිත පිටපතෙහි මාර්ගගතව පුරවන ලද තොරතුරුහි කිසිඳු සංශෝධනයක් (Edit) සිදු නොකළ යුතු ය.

